# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.05.02 පැය 1525 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out / 700 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මාලදිවයින් ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරයට අදාළ රථවාහන සැලැස්ම - කොළඹ රථවාහන කොට්ඨාසය.**

මාලදිවයින් ගරු ජනාධිපති Mohamed Muizzu මහතා 2026.05.03 දින සිට 2026.05.06 දින දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වීමට නියමිතව ඇත. එම සංචාරක කාලසීමාව තුල ශ්‍රී ලංකා පොලිසිය විසින් කොළඹ නගරය ආශ්‍රිතව විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- 2026.05.03 දින සවස් කාලයේ ප්‍රභූවරයා කටුනායක ජාත්‍යයන්තර ගුවන්තොටුපොලට පැමිණීමෙන් පසු කටුනායක කොළඹ අධිවේගී මාර්ගය, ග්‍රෑන්ඩ්පාස් ඔරුගොඩවත්ත හන්දිය, බේස්ලයින් පාර, බොරැල්ල හන්දිය, ඩී.එස්.සේනානායක හන්දිය, හෝර්ටන් පෙදෙස, නෙළුම් පොකුණ වටරවුම, ආනන්ද කුමාරස්වාමි මාවත, පුස්තකාල හන්දිය, මල් පාර හන්දිය, ලිබර්ටි වටරවුම, ශාන්ත මයිකල් වටරවුම, ශාන්ත මයිකල් පාර, ගාලු පාර, ශාන්ත මයිකල් පාර හන්දිය, ගාලු පාර, ගාලු මුවදොර වටරවුම, ගාලු මැද පාර, බාලදක්ෂ මාවත, එන්.එස්.ඒ. වටරවුම, ලෝටස් පාර, සෙරමික් හන්දිය, යෝර්ක් වීදිය ඔස්සේ පැමිණීමට නියමිතව ඇත.

**ප්‍රභූවරයා ගමන් ගන්නා කාලය තුල රථවාහන පොලිසිය විසින් පහත විකල්ප මාර්ග වෙත වාහන යොමු කිරීම සිදු කරනු ලබයි.**

**විකල්ප මාර්ග -**

**නුවර පාරෙන් කොළඹට ඇතුළුවන සැහැල්ලු වාහන**

- කැලණි පාලමෙන් කොළඹට ඇතුළු වී ග්‍රෑන්ඩ්පාස් බණ්ඩාරනායක පාරෙන් දකුණට හැරී ඉඟුරුකඩේ හන්දිය දක්වා ගමන් කර, වමට හැරී වේල්ස් කුමාර මාවත, ආමර් බාබර් වීදිය හන්දියෙන් වමට හැරී පංචිකාවත්ත වටරවුම, මරදාන පාලම් හන්දියෙන් වමට හැරී මරදාන පාර ඔස්සේ බොරැල්ල දක්වා ගමන් කර ප්‍රභූ රථ පෙළට අවහිරයක් නොවන අන්දමින් අවස්ථානුකුලව බොරැල්ල හන්දියෙන් කොටා පාරට ඇතුල්විය හැකිය.

**ගාලු පාර, හයිලෙවල් පාර සහ බේස්ලයින් පාර ඔස්සේ කොළඹට ඇතුළුවන වාහන**

- බොරැල්ල කනත්ත වටරවුම, පරණ බුලර්ස් පාර, මොඩල් ෆාම් හන්දිය, කාසල් වීදිය, ආයුර්වේද හන්දිය, පරණ පාර, ඔබේසේකරපුර හන්දිය, කොලොන්නාව, වැල්ලම්පිටිය, අංගොඩ හන්දිය, කැලණිමුල්ල, කැලණිය හරහා නුවර පාරට හෝ මීගමුව පාරට ගමන් කළ හැකිය.

**කොළඹ කොටුව, පිටකොටුව දෙස සිට මීගමුව පාරට, නුවර පාරට සහ අවිස්සාවේල්ල පාරට ගමන් ගන්නා වාහන**

- ඕල්කට් මාවත, කාර්මික විද්‍යාල හන්දිය, පංචිකාවත්ත වටරවුම, ආමර් වීදිය හන්දිය, ආමර් බාබර් වීදිය හන්දිය, වේල්ස් කුමාර මාවත හන්දිය , ඉඟුරුකඩේ හන්දිය, තොටළඟ හන්දිය, නවලෝක හන්දිය, නවලෝක වටරවුම, මීගමුව පාරට හෝ අවිස්සාවේල්ල දෙසට ගමන් කරන වාහන නුවර පාර හතරේ කණුව හන්දියෙන් දකුණට හැරී කැලණිය - බියගම මාර්ගයේ ගමන් කර බණ්ඩාරවත්ත හන්දියෙන් දකුණට හැරී කඩුවෙල හන්දියට ගමන් කර වමට හැරී අවිස්සාවේල්ල දෙසට ගමන් කළ හැකි අතර, මීට අමතරව රෙක්ලමේෂන් පාර ඔස්සේද කොළඹින් පිටවිය හැකිය.

**කොටුව, පිටකොටුව, කොම්පඤ්ඤවීදිය දෙස සිට ගාලු පාරට හයිලෙවල් පාරට 120 මාර්ගයට ගමන් කරන වාහන**

- ලිප්ටන් වටරවුම, සොයිසා වටරවුම, කන්නන්ගර මාවත ඔස්සේ ගමන් කර ප්‍රභූ රථ පෙළට බාධාවක් නොවන පරිදි අවස්ථානුකූලව හරහා යාමට අවස්ථාව ලබා දෙන අතර, ඒ අනුව කන්නන්ගර මාවතින් පැමිණ නෙළුම් පොකුණ වටරවුම හරහා නන්දා මෝටර්ස් හන්දිය, නිදහස් වටරවුම, රීඩ් මාවත ඔස්සේ තුම්මුල්ල දක්වා ගමන් කර පිටවිය හැක.

**2026.05.04 දින උදෑසන ප්‍රභූවරයා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ගමන් කිරීම.**

එම කාලය තුල එන්.එස්.ඒ.වටරවුම, ගාලු මැද පාර, බැංකු මාවත ඔස්සේ ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා බස් රථ ඇතුළු බර වාහන ඇතුළු වීම ප්‍රභූවරයාගේ සංචාරය සිදුවීමට පැය දෙකකට පෙර නැවැත්වීම සිදු කරන අතර, ප්‍රභූවරයා ගමන් ආරම්භ කිරීමෙන් පසු සියළුම වාහන ඇතුළු වීම සීමා කරනු ලැබේ.

**විකල්ප මාර්ග -**

**කොළඹින් පිටවන සියළුම වාහන**

- සෙරමික් හන්දියෙන් වමට හරවා කොම්පඤ්ඤවීදිය දෙසට හා ඩී.ආර්. විජේවර්ධන මාවතින්ද, ටෙක්නිකල් හන්දිය ඔස්සේ සංඝරාජ මාවතින්, මාලිගාවත්ත හා ආමර් බාබර් වීදිය ඔස්සේ ද, මරදාන ගාමිණි වටරවුම හා මරදාන පාර ඔස්සේද ගමන් කල හැකි අතර, කොම්පඤ්ඤවීදිය පොලිසිය වටරවුම, කුමාර රත්නම් පාර, කොම්පඤ්ඤවීදිය හන්දිය, සර් ජේම්ස් පිරිස් මාවත, පිත්තල හන්දිය, රතු කුරුස හන්දිය , පුස්තකාල වටරවුමෙන් දකුණට හැරී ආනන්ද කුමාරස්වාමි මාවත, ලිබර්ටි වටරවුමෙන් වමට හැරී ආර්.ඒ ද මෙල් මාවත ඔස්සේ කොළඹින් පිටවිය හැකිය.

**ගාලු පාර ඔස්සේ කොළඹට ඇතුළු වන වාහන**

- ගාලු මුවදොර වට රවුමෙන් දකුණට හරවා කොම්පඤ්ඤවීදිය දෙසට ගමන් කර කොළඹට ඇතුළු විය හැකිය.

**2026.05.04 දින දහවල් ප්‍රභූවරයා විහාරමහාදේවි උද්‍යානය වෙත ගමන් කිරීම.**

එම කාලය තුල සෙරමික් හන්දිය, රීගල් වටරවුම, කොම්පඤ්ඤවීදිය හන්දිය, පිත්තල හන්දිය, රතුකුරුස හන්දිය, පුස්තකාල වටරවුම, නෙළුම් පොකුණ වටරවුම, එෆ්.ආර්.සේනානායක මාවත ඔස්සේ විහාරමහාදේවි උද්‍යානය වෙත ගමන් කිරීම හා ධර්මපාල වටරවුම, රතුකුරුස හන්දිය, පුස්තකාල වටරවුම, මල්පාර, පිත්තල හන්දිය කොම්පඤ්ඤවීදිය වටරවුම, රීගල්, සෙරමික් හන්දිය දක්වා රථවාහන ගමනාගමනය සීමා කරනු ලැබේ.

විකල්ප මාර්ග -

**ගාලු පාර ඔස්සේ කොළඹට ගමන් කරන සියළුම වාහන**

- ගාලු මැද පාර ඔස්සේ, එන්.එස්.ඒ.වටරවුම, ජනාධිපති මාවත, බැංකු මාවත, යෝර්ක් වීදිය ඔස්සේ කොළඹට ඇතුළු විය හැක.

**කොළඹින් පිටවන සියළුම වාහන**

- ටෙක්නිකල් හන්දිය ඔස්සේ මරදාන/බොරැල්ල දෙසට හා ආමර් බාබර් හන්දිය දෙසට හා මාලිගාවත්ත ඔස්සේ බේස්ලයින් මාර්ගයට පිවිස කොළඹින් පිටවිය හැක.

**2026.05.04 දින සවස ජනාධිපති මන්දිරය වෙත ගමන් කිරීම.**

එම කාලය තුල බැංකු මාවත, ජනාධිපති මාවත, බැංකු මාවත හන්දිය, ජනාධිපති මාවත ජනාධිපති මන්දිරය දක්වා රථවාහන ගමනාගමනය සීමා කරනු ලැබේ.

විකල්ප මාර්ග -

**කොළඹ පිටකොටුව දෙස සිට කොළඹින් පිටවන වාහන**

- සෙරමික් හන්දියෙන් වමට හරවා කොම්පඤ්ඤවීදිය දෙසට හා ඩී.ආර්. විජේවර්ධන මාවතින්ද, හයිලෙවල් පාර, ගාලු පාර හා 120 මාර්ගයට ගමන් කරන සියළුම වාහන ටෙක්නිකල් හන්දිය ඔස්සේ මරදාන බොරැල්ල දෙසට හා ලිප්ටන් වටරවුම, සොයිසා වටරවුම කන්නන්ගර මාවත ඔස්සේ නෙළුම් පොකුණ වටරවුම හරහා නන්දා මෝටර්ස් හන්දිය, නිදහස් වටරවුම, රිඩ් මාවත ඔස්සේ කොළඹින් පිටවිය හැක.

**ගාලු පාර, හැව්ලොක් පාර, හයිලෙවල් පාර ඔස්සේ කොළඹට ඇතුළුවන වාහන**

- ලිබර්ටි වට රවුමෙන් වමට හැරී පිත්තල හන්දිය ඔස්සේද, තුන්මුල්ල හන්දිය ඔස්සේ ගමන් කර රිඩ් මාවත තර්ස්ටන් පාර, ජේ.ඕ.සී. හන්දිය, ග්ලාස් හවුස් හන්දිය, නන්දා මෝර්ටස් හන්දිය, නෙළුම් පොකුණ හරහා කන්නංගර මාවත ඔස්සේ සොයිසා වටරවුම හරහා ගමන් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

**2026.05.05 දින උදෑසන කෞතුකාගාරය, මාලදිවයින් තානාපති කාර්යාලය හා මාලදිවයින් සංස්කෘතික මධ්‍යස්ථානය වෙත ගමන් කිරීම.**

ගමන් මාර්ගය -

- සෙරමික් හන්දිය, රීගල් වටරවුම, කොම්පඤ්ඤවීදිය හන්දිය, පිත්තල හන්දිය, පුස්තකාල හන්දිය, ග්ලාස් හවුස් හන්දිය ඔස්සේ කෞතුකාගාරය වෙත.
- නන්දා මොර්ටස්, නිදහස් වටරවුම, තුම්මුල්ල හන්දිය, බෞද්ධාලෝක මාවත ආර්.ඒ. ද මෙල් මාවත, ලෝරන්ස් පාර, ගාලු පාර, මෙල්බෝන් ඇවනිව් ඔස්සේ තානාපති කාර්යාලය වෙත.

- මෙල්බෝන් ඇවනිව් හන්දිය, ගාලු පාර වජිර පාර හන්දිය, හැව්ලොක් පාර, මායා වටරවුම, ඩබ්.ඒ. සිල්වා මාවත පරණ හැව්ලොක් පාර හන්දිය, කවිරත්න මාවත ඔස්සේ මාලදිවයින් සංස්කෘතික මධ්‍යස්ථානය වෙත.

නැවත පැමිණීම -

- ඩබ්.ඒ සිල්වා මාවත, පරණ හැව්ලොක් පාර හන්දිය, මායා වටරවුම, හැව්ලොක් පාර, තිඹිරිගස්යාය පාර හන්දිය, තුම්මුල්ල, ජේ.ඕ.සී හන්දිය, ග්ලාස් හවුස්, පුස්තකාල හන්දිය, මල් පාර හන්දිය, පිත්තල හන්දිය,කොම්පඤ්ඤවීදිය හන්දිය, මැලේ වීදිය, රීගල්, සෙරමික් හන්දිය ඔස්සේ නැවත පැමිණීමට නියමිතව ඇත.

විකල්ප මාර්ග -

**ගාලු පාර ඔස්සේ කොළඹට ඇතුළු වන සියළුම වාහන**

- ගාලු පාර කොල්ලුපිටිය හන්දිය ගාලු මැද පාර ඔස්සේ කොළඹට ඇතුළු විය හැකිය.

**පිටකොටුවෙන් පිට වී ගාලු පාරට ගමන් කරන සියළුම වාහන**

- මරදාන ටෙක්නිකල් හන්දිය ඔස්සේ බේස්ලයින් මාර්ගය හරහා ද බොරැල්ල නාරාහේන්පිට දෙසින් ද ගමන් කල හැකිය.

**නුවර පාර හා අවිස්සාවේල්ල දෙසට ගමන් කරන වාහන**

- ටෙක්නිකල් හන්දිය සංඝරාජ වටරවුම ඔස්සේ මාලිගාවත්ත හා ග්‍රෑන්ඩ්පාස් දෙසින් කොළඹින් පිටවිය හැකිය.

**2026.05.06 දින උදෑසන කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත ගමන් කිරීම.**

එම කාලය තුල, බැංකු මාවත, ජනාධිපති මාවත, එන්.එස්.ඒ.වටරවුම, ගාලු මැද පාර, කොල්ලුපිටිය හන්දිය, ලිබර්ටි වටරවුම, රතුකුරුස හන්දිය, පුස්තකාල වටරවුම, හෝර්ටන් වටරවුම, ඩී.එස්.හන්දිය, බොරැල්ල හන්දිය, බන්ධනාගාර හන්දිය, දෙමටගොඩ හන්දිය, ඉංග්‍රම් හන්දිය, ඔරුගොඩවත්ත හන්දිය, අධිවේගී මාර්ගය ඔස්සේ ගමන් කිරීමට නියමිතව ඇත.

විකල්ප මාර්ග -

**නුවර පාරෙන් කොළඹට ඇතුළුවන සැහැල්ලු වාහන**

- කැලණි පාලමෙන් කොළඹට ඇතුල් වී ග්‍රෑන්ඩ්පාස් බණ්ඩාරනායක පාරෙන් දකුණට හැරී ඉඟුරුකඩේ හන්දිය දක්වා ගමන් කර වමට හැරී වේල්ස් කුමාර මාවත, ආමර් බාබර් වීදිය හන්දියෙන් වමට හැරී පංචිකාවත්ත වටරවුම මරදාන පාලම් හන්දියෙන් වමට හැරී මරදාන පාර ඔස්සේ බොරැල්ල දක්වා ගමන් කල හැකිය.
- ප්‍රභූ රථ පෙළට අවහිරයක් නොවන අන්දමින් අවස්ථානුකූලව බොරැල්ල හන්දියෙන් කොටා පාරට ඇතුල්වීමට අවස්ථාව ලබා දෙනු ලබන අතර අධිවේගී මාර්ගය ඔස්සේ ඇතුළු වන වාහන අධිවේගී මාර්ගයේ ඉඟුරුකඩේ වරාය පිටවීම භාවිතා කරමින් කොළඹට ඇතුළු විය හැකිය.

**ගාලු පාර, හයිලෙවල් පාර සහ බේස්ලයින් පාර ඔස්සේ කොළඹට ඇතුළුවන වාහන**

- බොරැල්ල කනත්ත වටරවුමට ඇතුළු කර පරණ බුලස් පාර, මොඩල් ෆාම් හන්දිය, කාසල් වීදිය, ආයුර්වේද හන්දිය, පරණ පාර, ඔබේසේකරපුර හන්දියෙන් වමට හැරී කොලොන්නාව, වැල්ලම්පිටිය, අංගොඩ හන්දිය, කැලණිමුල්ල, කැලණිය හරහා නුවර පාරට හා මීගමුව පාරට ගමන් කළ හැකිය. එම මාර්ගයන් ඔස්සේ කොළඹට ඇතුළු වීමටද හැකිය.

**කොළඹ කොටුව, පිටකොටුව දෙස සිට මීගමුව පාරට, නුවර පාරට සහ අවිස්සාවේල්ල පාරට ගමන් කරන වාහන.**

- ඕල්කට් මාවත, කාර්මික විද්‍යාල හන්දිය පංචිකාවත්ත වටරවුමෙන් වමට හැරී ආමර් වීදිය හන්දිය, ආමර් බාබර් වීදිය හන්දිය, වේල්ස් කුමාර මාවත හන්දිය, ඉඟුරුකඩේ හන්දිය, තොටළඟ හන්දිය, නවලෝක හන්දිය, නවලෝක වටරවුමෙන් වමට හැරී මිගමුව පාරට ද දකුණට හැරී අවිස්සාවේල්ල දෙසට ගමන් කරන වාහන නුවර පාර 04 කණුව හන්දියෙන් දකුණට හැරී කැලණිය බියගම මාර්ගයේ ගමන් කර බණ්ඩාරවත්ත හන්දියෙන් දකුණට හැරී කඩුවෙල හන්දියට ගමන් කර වමට හැරී අවිස්සාවේල්ල දෙසට ගමන් කළ හැක. මීට අමතරව රෙක්මලේෂන් පාර ඔස්සේ කොළඹින් පිටවිය හැකි අතර එම මාර්ගයන් ඔස්සේ කොළඹට ඇතුළු වීමද සිදු කල හැක.

**කොටුව, පිටකොටුව, කොම්පඤ්ඤවීදිය දෙස සිට හා ගාලු පාරට හයිලෙවල් පාරට 120 මාර්ගයට ගමන් කරන වාහන**

- ලිප්ටන් වටරවුම, සොයිසා වටරවුම, කන්නන්ගර මාවත ඔස්සේ ගමන් කර ප්‍රභූ රථ පෙළට බාධාවක් නොවන පරිදි අවස්ථානුකූලව හරහා යාමට අවස්ථාව ලබා දෙන අතර, ඒ අනුව කන්නන්ගර මාවතින් පැමිණ නෙළුම් පොකුණ වටරවුම හරහා නන්දා මෝර්ටස් හන්දිය නිදහස් වටරවුම, රීඩ් මාවත ඔස්සේ තුම්මුල්ල දක්වා ගමන් කර පිටවිය හැකි අතර එම මාර්ග ඔස්සේ කොළඹට ඇතුළුවිය හැකිය.

2026.05.03 දින සිට 2026.05.06 දින දක්වා කාලසීමාව තුල ප්‍රභූ සංචාරයට අදාලව අවස්ථානුකූලව ඇති වන තත්ත්වයන් මත ඉහත දක්වා ඇති මාර්ගයන්හි රථවාහන ගමනාගමනය සීමා කිරීම් සිදුවිය හැකිය.

**ප්‍රභූවරයා ගමන් ආරම්භ කිරීමට පැය දෙකකට පෙර සිට ඉහත ගමන් මාර්ගයන් වෙත බර වාහන ඇතුළු නොකරන අතර අනෙකුත් වාහන ඇතුළුවීම සීමා කරනු ලබයි.**

ප්‍රභූවරයාගේ සංචාරක කාලසීමාව තුල ඉහත රථවාහන සැලැස්මට අනුව විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට රියැදුරන්ගෙන් හා මහජනතාවගෙන් පොලිසිය ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**